# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2318/13 - 2023 පෙබරවාරි මස 06 වැනි සඳුදා - 2023.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.-බී 5/2013 (II)

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත**

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 82ට වගන්තිය ප්‍රකාර ඡන්ද පෙත්සමක් වනසිංහ මුදියන්සේලාගේ සුනිල් ශාන්ත වනසිංහ යන පෙත්සම්කරු විසින් දිසානායක මුදියන්සේලාගේ තරංග හර්ෂක ප්‍රිය ප්‍රසාද් දිසානායක සහ තවත් අය වගඋත්තරකරුවන් කරමින් ඌව පළාත්බද මොණරාගල මහාධිකරණයට ඉදිරිපත් කරන ලද හෙයින් ද;

අංක 01/2018 දරන එකී ඡන්ද පෙත්සමට අදාළව, එකී ආඥාපනතේ 82ප වගන්තිය ප්‍රකාරව මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් සකස් කරන ලද වාර්තාව ගරු ජනාධිපතිවරයා වෙත එකී ආඥාපනතේ 82අආ වගන්තිය ප්‍රකාරව එවනු ලැබ ඇති හෙයින් ද;

එකී ආඥාපනතේ 82අඈ වගන්තිය ප්‍රකාර මැතිවරණ විනිශ්චයකාරවරයාගේ වාර්තාවේ පිටපතක් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු යයි ගරු ජනාධිපතිතුමා විසින් විධාන කරනු ලැබ ඇති හෙයින් එකී වාර්තාවේ පිටපතක් මෙහි පහත පළ කරනු ලැබේ.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ඊ. එම්. එස්. බී. ඒකනායක,**
ජනාධිපති ලේකම්,

2023 පෙබරවාරි මස 6 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය

1A - G 38772 — 11 (2023/02)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඌව පළාත්බද මොණරාගල මහාධිකරණයේ දී ය.
අතිරේක මහාධිකරණ විනිසුරු ආර්.එස්.ඒ. දිසානායක මැතිතුමා ඉදිරිපිට දී ය
නඩු අංකය : මැතිවරණ පෙත්සම් 01/2018
දිනය : 2021.09.03

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 82ප වගන්තිය ප්‍රකාරව**
**මැතිවරණ විනිශ්චයකාරවරයාගේ වාර්තාව**

ඉහත නඩු අංකය යටතේ මොණරාගල මහාධිකරණයේ පවරන ලද මැතිවරණ පෙත්සමට අදාළව පවත්වන ලද විභාගය සම්බන්ධයෙන් වන නියෝගය 2021.09.13 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

එම විභාගයේ දී හෙළිදරව් වූ සහ ඔප්පු කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් මැතිවරණ විනිශ්චයකාරවරයාගේ වාර්තාව පහත පරිදි ඉදිරිපත් කර සිටිමි.

මෙම නඩු විභාගය අවසානයේ දී මා විසින් ලබාදෙන ලද නියෝගයෙහි එම නියෝගය සඳහා හේතු වූ සියලු කරුණු මනා ලෙස විස්තර කරනු ලැබ ඇත. ඒ අනුව එම නියෝගයේ පිටපතක් මෙම වාර්තාව සමග අමුණා ඉදිරිපත් කරමි. එම නියෝගයේ මනා ලෙස විස්තර කර ඇති පරිදි එම විභාගයේදී ඔප්පු වූ සහ ඔප්පු නොවූ කරුණු සම්බන්ධයෙන් පහත සඳහන් ලෙස සාරාංශ ගත කොට මෙම වාර්තාව ඉදිරිපත් කරමි.

2018.02.10 වැනි දින මොණරාගල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මදුරුකැටිය ඡන්ද කොට්ඨාසය සඳහා පවත්වන ලද ඡන්ද විමසීමේ අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වූ සහ එම ඡන්ද විමසීමේ දී වැඩිම ඡන්ද ලබාගෙන ජයග්‍රහණය කළ අපේක්ෂකයා වන දිසානායක මුදියන්සේලාගේ තරංග හර්ෂක ප්‍රිය ප්‍රසාද් දිසානායක යන අයට එරෙහිව ඉදිරිපත් වූ ඔහු විසින් සිදුකළේ යැයි කියනු ලබන දූෂණ හෝ නීතිවිරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් ඔප්පු වූ සහ ඔප්පු නොවූ කරුණු පහත පරිදි වේ.

(අ) ඡන්ද පෙත්සමේ 12(i) (ii) ඡේදයන්හි දක්වා ඇති ස්වේච්ඡා සංවිධානවලට මුදල්, ද්‍රව්‍යයන් සහ උපකරණ ලබාදීම ද, ඇතැම් නිවාසවලට නව ගෘහස්ත විදුලි සම්බන්ධතා ලබාදීම ද මෙම අපේක්ෂකයා වන , දිසානායක මුදියන්සේලාගේ තරංග හර්ෂක ප්‍රිය ප්‍රසාද් දිසානායක විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් සිදුකළ බවට නඩු විභාගයේ දී ඔප්පු වී නොමැති බව.

(ආ) ඡන්ද පෙත්සමේ 13 වන ඡේදයේ දැක්වෙන පරිදි මදුරුකැටිය එකමුතු අවමංගල්‍යාධාර සමිතියට මුදල් ලබාදීම, ඔයිල් ෆාම් රණමයුර ක්‍රීඩා සමාජයට සහ කළුගල මරණාධාර සමිතියට ද්‍රව්‍යමය ආධාර ලබාදීම. එම වැරදි සම්බන්ධයෙන් චෝදනා එල්ල වන අපේක්ෂකයා වන දිසානායක මුදියන්සේලාගේ තරංග හර්ෂක ප්‍රිය ප්‍රසාද් දිසානායක යන අය විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් සිදුකර ඇති බවට නඩු විභාගයේ දී ඔප්පු කර නොමැති බව.

(ඇ) ඡන්ද පෙත්සමේ 12(iii) ඡේදය මගින් දක්වා ඇති 2017.11.28 වන දින හෝ ආසන්න දිනයක මදුරුකැටිය මැතිවරණ කොට්ඨාසයේ ඇතැම් නිවාස සඳහා නව ජල සම්බන්ධතා ලබාදෙමින් අල්ලස් ලබාදීම යන වරද සිදුකර ඇති බවට ඡන්ද අපේක්ෂකයෙකු වන දිසානායක මුදියන්සේලාගේ තරංග හර්ෂක ප්‍රිය ප්‍රසාද් දිසානායක යන අයට එරෙහිව ඇති වරද එම අපේක්ෂකයාගේ දැනුම සහ කැමැත්ත ඇතිව ඔහුගේ නියෝජිතයෙකු වන ජාතික හැඳුනුම්පත් අංක 812811401V දරන සිරියරත්න අනුර ශාන්ත කුමාර යන අය මාර්ගයෙන් සිදුකරනු ලැබ ඇති බව ඔප්පු කරනු ලැබ ඇති බව.

**ආර්. එස්. ඒ. දිසානායක,**
මැතිවරණ විනිශ්චයකරු.

2021 සැප්තැම්බර් මස 13 වැනි දින,
අතිරේක මහාධිකරණ විනිසුරු - මොණරාගල,

EOG 02 - 0049

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.